# කොටස්කරුවන් (THE STAKEHOLDERS)

## අරමුදල් ආකෘතියේ කොටස්කරුවන් (FUNDING MODEL STAKEHOLDERS)

දිවයින තුල ගෝලීය අරමුදලේ ක්‍රියාදාමයන් සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරන කොටස්කරුවන්ගේ ලැයිස්තුව පහත දැක්වේ.

### CCM යාන්ත්‍රණය (Country Coordinating Mechanism (CCM)

Country Coordinating Mechanism (CCM) යනු හඳුනා ගත් ප්‍රධාන රෝග 3 හමුවේ විවිධ කොටස්කරුවන් නියෝජනය කරනු ලබන පුද්ගලයින් ගෙන් සම්පාදනය වූ යාන්ත්‍රණයකි; රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය නියෝජිත කණ්ඩායම්, සිවිල් සංවිධාන, රෝග ආසාධිත හෝ අවධානමට ලක්වූ ප්‍රජා, අධ්‍යාපනික ආයතන, හා අන්තර්ජාතික හෝ බහුපාර්ශවීය සංවර්ධනය කෙරේ දායක වන ආයතන මීට අයත් වේ.

### CCM කමිටු (CCM committees)

CCM බොහෝ විට සිය කාර්යයන් ඉටුකිරීමේදී එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුලත ගන්නා තීරණ වලට සහය වන විධායක සහ තාක්ෂණික කමිටු නිර්මාණය කර ගනු ලබයි. මෙම විධායක කමිටුව බොහෝ විට සභාපති, හෝ සම-සභාපති සහ උපසභාපතිවරුන් සහ CCM හි අනෙකුත් නිලධාරීන්ගෙන් සමන්විත වේ. තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් තේමාන්විතව සහ/හෝ රෝග-පාදක කරගත් (උදා: මැලේරියා සඳහා වූ තාක්ෂණික කමිටුව) කර්තව්‍යයක් ඉටු කරති.

### CCM ලේකම් කාර්යාලය (CCM Secretariat)

CCM හි දෛනික කටයුතු සඳහා සහාය වන්නේ දේශීය ලේකම් කාර්යාලයක් මගිනි. අනෙකුත් අයගෙන් ස්වාධීනව, ලේකම් කාර්යාලය මගින් CCM හි වැඩසටහන් සංවිධානය හා සම්බන්ධීකරණය කිරීමත්, ගොලීය අරමුදලේ දේශීය කණ්ඩායම හා ලේකම් කාර්යාලය හා අතරමැදියෙකු ලෙස ක්‍රියා කිරීමත්, හා CCM හි අයදුම් ලේඛන හා වාර්තා ලඟ තබා ගැනීමත් සිදුවේ.

### අරමුදල් සංචිතය සම්බන්ධ කලමනාකරු සහ දේශීය කණ්ඩායම

### (Fund Portfolio Manager and the Country Team)

ගෝලීය අරමුදල විසින් ලබාදෙන අරමුදල් සංචිතය පිලිබඳව වගකීම් දැරීමට කලමනාකරුවන් (FPMs) පත් කරනු ලබන අතර, ඔවුහු ලේකම් කාර්යාලයේ අනෙකුත් තාක්ෂණික කාර්යමණ්ඩලයද සමග එක්ව දේශීය කණ්ඩායම (CCM සමග කටයුතු කරන ප්‍රධාන අයදුම් සංවර්ධනය හා ක්‍රියාපටිපාටි සඳහා උපදෙස් ලබා දෙන්නන්) නිර්දේශ කරනු ලබති.

### දේශීය අරමුදල් සම්බන්ධ නියෝජිත (Local Fund Agent)

දේශීය අරමුදල් සම්බන්ධ නියෝජිත (LFA) දීමනා හා අදාල වැඩසටහන් පූර්ව-අතරතුර-හා-අපර වශයෙන් අධීක්ෂණයකට හා ඇගයීමකට ලක් කරනු ලබයි. PR තොරතුරු වෙත පිවිසීම, දීමනා සම්බන්ධ ප්‍රගති සමාලෝචනය, අරමුදල් නිසියාකාරව යොදාගැනීම පිලිබඳ වගකීම් දැරීම අනෙකුත් අයට සාපේක්ෂව ඔවුනට පැවරී ඇති රාජකාරී වේ.

### ජාතික රෝග නිවාරණ වැඩසටහන් (National Disease Programmes)

HIV, ක්ෂය රෝගය, හා මැලේරියා මර්ධනය සම්බන්ධ ආයෝජනයන් හා/හෝ දේශීය ක්‍රමෝපායන් සමග මෙම අරමුදල් අයදුම් හා සමපාත විය යුතු අතර, ජාතික රෝග නිවාරණ වැඩසටහන් හාද සම්බන්ධ වීම වැදගත් වේ. මන්ද, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිත ආයතන ආධාර සම්බන්ධව මැදිහත්වී ක්‍රියා කිරීම,

ක්‍රමෝපායික තොරතුරු එක්රැස් කිරීම, වැඩසටහන් සඳහා වියදම් සැකසීම හෝ සම-මූල්‍ය වැඩසටහන් සඳහා අරමුදල් රැස් කිරීම වැනි වැදගත් කාර්යභාරයන් ඉටු කිරීමට බැඳී සිටින බැවිනි.

## සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජාතික AIDS කමිටුව (MOH and National AIDS Commissions)

සෞඛ්‍ය අමාත්‍යාංශය(MOH), හෝ HIV/AIDS සම්බන්ධව ජාතික කමිටුව (NAC) CCM හි සාමාජිකයින් ලෙස හෝ වැඩපිළිවෙලෙහි නායකත්වය ගනිමින් අසුන් ගන්නා අතර, ප්‍රධාන රෝග 3 සඳහා දේශීය ක්‍රමෝපායන් භාර ගැනීමත්, ආයෝජන සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමටත් මූලිකත්වය ගනී.

## අන්තර්ජාතික නියෝජිතයින් (International Agencies)

WHO, UNAIDS සහ අනෙකුත් ද්විපාර්ශ්වික ආධාරකරුවන් වැනි අන්තර්ජාතික සංවර්ධන සංවිධාන සාමාජිකයින් ලෙස CCM හි අසුන් ගන්නා අතර දේශීය වැඩසටහන් සඳහා තාක්ෂණික සහායද සපයයි.

## වැඩසටහන් ක්‍රියාකරවන්නන් (Programme Implementers)

අරමුදල් අයදුම් ඉදිරිපත් කිරීමට පෙර, CCM විසින් ප්‍රධාන ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමුඛත්වය ලබා දීමට සුදුසු PR තෝරා ගනු ලබයි. PR ආයතනය රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක් විය හැකි අතර, අරමුදල් සැපයුම සම්බන්ධ අයදුමේ හඳුනා ගත් ක්‍රියා-ව්‍යුහය මත පදනම්ව PR උප සහකරු ආයතන (SRs) ඇති කර ගනු ලබයි. එමගින් අරමුදලේ විශේෂ සංරචක ක්‍රියාවට නැංවීමට හැකිවේ.

## සිවිල් සංවිධාන, ප්‍රජා කණ්ඩායම් හා අධි අවදානම් ප්‍රජාවන්

## (Civil society, community groups, & key populations)

මෙම අරමුදල් ආකෘතිය තුල සිවිල් සංවිධාන, ප්‍රජා කණ්ඩායම්, අධි අවදානම් කලාප, රෝග ආසාධිත හෝ අවධානමට ලක්වූ පුද්ගලයින් නියෝජනය කරන සංවිධාන කැපී පෙනෙන භූමිකාවක් රඟ දක්වනු ලැබීම විශේෂත්වයකි. CCM තුල ඔවුන්ගේ නියෝජනය, හා ප්‍රජා අතර ඇති කරන අඛණ්ඩ සංවාද දේශීය ක්‍රමෝපායන් සහ වැඩසටහන් ශක්තිමත් කිරීමට ඉමහත් රුකුලක් ගෙන දේ. APCRG වැනි අධි අවදානම් කලාප හා සිවිල් සංවිධාන සම්බන්ධ කලාපීය ජාල හා ආයතනද මේ අතර පවතින බව සිහි ගැන්විය යුතුවේ. මන්ද ගෝලීය අරමුදල් ආශ්‍රිත තාක්ෂණික සහය හා තොරතුරු ව්‍යාප්ත කිරීම වැනි කර්තව්‍යයන් ඔවුන් විසින් සිදු කරනු ලබන නිසාවෙනි.

## තාක්ෂණික සහය සපයන්නන් (Technical Assistance Providers)

රටවල් තුළ, රෝග මර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා හා/හෝ ගෝලීය අරමුදල හා සම්බන්ධවී සිටින සිවිල් සංවිධාන, ප්‍රජා කණ්ඩායම්, සහ අධි අවදානම් කලාප පුද්ගලයින් හට තාක්ෂණික සහාය ලබා දෙන කණ්ඩායම් වේ. මෙම තාක්ෂණික සහය සපයන්නන් අතර UNAIDS, French 5%, හා USAID වැනි ආයතන මූලිකත්වයක් ගනු ලබයි.